**ශීර්ෂය 328 – මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 22 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 352.80 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 346.57 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.23 ක් හෙවත් සියයට 1.77 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 312.30 | 310.14 | 2.16 | 0.69 |
| මූලධන | 40.50 | 36.43 | 4.07 | 10.05 |
| **එකතුව** | **352.80** | **346.57** | **6.23** | **1.77** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18.00 | 11.04 | 9.00 | 11.71 | 50.00 | 40.16 |

**2.3 විගණන නිරීක්ෂණය**

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

| | | |
|---|---|---|
| (ඈ) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 |
| (ඇ) | මුදල් පොත / සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 436 |
| (ඉ) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 |
| (ඊ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (උ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඌ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (එ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (ඒ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (ඔ) | ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.2.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.2.2 විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 වන ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

**3.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 21 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුව සතු කැබ් රථයක් වසර දෙකකට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව වාර්ෂිකව වාහන හා උපකරණ පිළිබඳව සමීක්ෂණය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාහන සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ii) 2015 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 හා 3.5 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 කාර්යසාධනය

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් කළ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සම්පූර්ණ වශයෙන් ඉටු කරගෙන නොතිබුණි. ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන් ගෙන් සියයට 50 කට වඩා අඩුවෙන් ඉටුකළ කාර්යයන් පහත දැක්වේ.

(i) වෘත්තීය ආහාර සැපයුම් සේවාව ක්ෂේත්‍රයට පිවිසීම සඳහා නිපුණතා වර්ධනයට සහන සැලසීම

- ඉහළ හැකියා සහ වඩාත් යහපත් ගෙවීම් සහිත ක්ෂේත්‍රයන්හි රැකියා යෝග්‍යතාවය වැඩි කිරීම.
- තරුණ ප්‍රජාව කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා වූ වැඩසටහන් දෙස යොමු කරවීම සඳහා යාන්ත්‍රීකරණය, නව්‍යකරනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට උද්‍යාන අලංකරණය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ii) කෙටිකාලීන හා දිගුකාලීන වශයෙන් ශ්‍රම සැපයුම හා ඉල්ලුම අතර සම්බන්ධය ඇති කිරීම සඳහා "ජාතික මානව සම්පත් පැතිකඩ" සඟරාව සඳහා තොරතුරු ලබා ගැනීම නිසි පරිදි සිදු කර නොතිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව සෑම ගෙවීමක් සඳහාම ගෙවීම් ලබන්නාගෙන් තහවුරුවක් ලබාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සේවකයින් 484 දෙනෙකුට වැටුප් ගෙවීමට අදාල තහවුරු ලබා නොගැනීම නිසා ස්ථාන මාරු වී ගිය, සේවය අතහැර ගිය, මිය ගිය හා විදේශගත වූ සේවකයින් හටද වැටුප් ගෙවීමේ අවධානමක් පැවැතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 2,536,372 ක් වැයකර මුද්‍රණය කර ලබාගෙන තිබුණු අත්පොත්, අත්පත්‍රිකා හා සඟරා ලැබීම් හා නිකුත් කිරීම් විධිමත් පරිදි ලේඛනගත කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයෙන් බැහැර රාජකාරි ඉටු කරන නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම හා නිවාඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වී තිබුණු බව සනාථ කිරීමට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද දෙපාර්තමේන්තුවේ මානව සම්පත් නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් විසින් මාසික ඉදිරි වැඩසටහන් අදාළ මාසයට පෙර මාසයේ 25 දිනට පෙර දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 16 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 181 ක ඉදිරි වැඩසටහන් අවස්ථා 753 කට අදාළව ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණු අතර, අවස්ථා 263 කට අදාළව ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ මාසික ප්‍රගතිය ඊළඟ මාසයේ 5 වන දිනට පෙර දෙපාර්තමේන්තුව වෙත යොමු කළයුතු වුවත්, 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 16 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 181 ක මාසික ප්‍රගති වාර්තා 537 ක් ප්‍රමාද වී ලැබී තිබුණු අතර, අවස්ථා 197 ක් සඳහා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 08 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 673 | 532 | 141 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 13 | 02 |
| | **එකතුව** | **703** | **553** | **150** |